How can anything be more important to me than my reality? We all have our own unique reality and it affects our lives to a great degree; it advances our desire to live, it separates us from the rest and makes us feel that we matter. What matters the world to me may not mean anything to you and vice versa but just because you cannot comprehend something doesn't mean it doesn't exist or isn't real. Unfortunately, most of us are too ignorant and narrow-minded to unhesitatingly oppose what we cannot come to terms with. We let our loved ones down and sometimes we even drive them to give up on themselves simply because we believe only what we can understand is true and accurate.

Mental illnesses are not a new thing to the world – it has always been there. Depression, among other mental illnesses, holds a special place. It existed far back in the past, it exists today and it will, sadly, continue to exist in future, too. The number of persons the world lost due to depression and the number of suffering souls living with depression is tremendous. You may have enjoyed the work of musicians, actors and writers who battled with depression and thought how magnificent and artistic their minds are. But you never see the obscure darkness they tried to suppress and cover up through their creations until they decide to leave this world. Sadly, it's only when infamous figures die people start talking about the gravity of mental health, we tend to forget about millions of ordinary people who struggle with depression.

I believe the term 'depression' is overused to refer to occasional negative feelings such as sadness, despair and inertia. But sometimes, aforementioned negative feelings arise more often and persist, gradually weakening us and making it difficult and sometimes nearly impossible even to perform trivial daily chores. These feelings last longer and get stronger. There are people who battle with depression for years, decades and sometimes the rest of their life. There is a fine difference between so-called depression you may experience immediately after a bad experience which declines with time and depression which is quite capable of stealing the very meaning of your life. It can slowly, relentlessly and completely take your happiness, motivation and sometimes will to live, away.

It could be your wife who doesn't reciprocate your love; it could be your father who spends half of all his money for booze; it could be your child who's always exhausted and is nowhere near good grades; it could be your employee who's always behind the deadlines; it could be your best friend who you think changed with time; or, it could already be you who is always sad and cannot see the slightest good in life. Depression is roaming around us, living with and among us and sometimes growing within us, turning our lives into a lifeless existence. In order to fight depressive thoughts, people who struggle with depression sometimes choose coping-mechanisms. Coping-mechanisms may range from extreme self-harming such as cutting, burning or substance abuse to insatiate addiction to sleep, work, songs or video games. So if any person known to you indicates any of above, there is a chance that they may be struggling.

The question is, what would do you about it? Would you keep ignoring that person in your life until they fall apart or would you at least try to accept what you cannot understand? It's okay to not understand depression perfectly. As a matter of fact, you cannot understand what depression really is as much as a person who has in actuality experienced it. You don't have to do much. Just lend your ears and be with them, give them a semblance of hope, let them know that they are adequate and important to you – that's more than sufficient to be the reason they don't give up.

If you or someone you know is struggling, don't hesitate to seek help!

Source of images -http://miamioh.edu
http://www.lawyerswithdepression.com/resources/



# ජීවී



Sahan Kaseera

රාණි අක්කා බැණලා බැණලා ගෙදරින් එළියට ගියා. කම්මුල් පාරවල් දෙක තුනක්ම වැදුණු නිසා කම්මුල තඩිස්සි වෙලා ඇති. ශලිනි කණ්ණාඩියෙන් මූණ බැලුවා. ඒත් හින්දි චිත්‍රපට වල වගේ මූණ ඉදිමිලා, කම්මුල් ගෙඩිගැහිලා නැහැ. ප්‍රීති සින්ටාට නම් සැරෙන් වචනයක් කිව්වත් කම්මුල් දෙක ජම්බු වගේ වෙනවා. කොයි වෙලේ බැලුවත් දර ලිප් මොළොවන, වළං හෝදන, රාණි අක්කගේ ගොරහැඩි අත්වලින් ගුටි කාලාත් මේ කම්මුල් වල වෙනසක් වෙලා නැහැ. මෙච්චර වෙලා නොදැනුණු දුකක් ශලිනිගේ හිතට සේන්දු වෙන්න ගත්තා.

"තෝ නිසා මට මගේ බිස්නස් එක නැතිකර ගන්න බෑ. බැහැපං බැල්ලි මෙතනින්" රාණි අක්කා එහෙම කියලා බැන්නට ශලිනිට මෙතැන අතැරලා යන්න වෙන තැනක් නැහැ. ඒක රාණි අක්කත් දන්නවා. අනිත් කාරණේ රාණි අක්කට වුණත් මඟුල් ගෙවල් දානේ ගෙවල් ගාණේ ගිහිං තනියම උයන්න බැහැ. දවසේ කුලියට ගෝලයෝ ගත්තොත් ආයේ ඉතින් විසුමක් නෑ. ඒ නිසා ශලිනි ඉන්න එක රාණි අක්කට හිතට හයියක්. "කමක් නෑ. ඔන්න ඔහේ ටික කාලයක් බැණුම් අහගෙන ඉන්නවා" කියලා හිත හදාගත්ත ශලිනි ගෙනල්ලා තිබ්බ භාජන ටික අඩුක් කරන්න ගත්තා. කලබලේ අස්සේ දැක්කේ නැතුවට සමහර ඒවා හරියට හේදිලත් නැහැ.

කේටරිං සර්විස් එකක සහායිකාව වෙන්න කලින් ශලිනිගේ ජීවිතේ ලංකා සිතියම පුරාම කැරකුණා. ආනමඩුවේ නාමල් නමින් ඉපදුණාට සාමාන්‍ය පෙළ කරන්නේ කුරුණෑගල පැත්තේ පිරිවෙනකින්. මනමේ කතාවේ හොඳම ගෝලයට රාජගුරුන්ගේ දුවව ලැබුණා. හොඳම ගෝලයා නොවුණු නාමල්ට රාජගුරුත් එක්කම පිරිවෙණෙන් එළියට බහින්න වුණා. කෝකිල හඬ කන් පිනවනවද රන් ස්වරයද කියලා බල බලා ඉන්න වෙලාවක් තිබ්බේ නැහැ. ඒ වෙනකොට සාමාන්‍ය පෙළ ගණිතය අසමත් වෙලා උන්නු නාමල්ව ගම්පහ පැත්තේ බෝඩිමක නවත්තලා පුද්ගලික ඉස්කෝලෙකට දාන්න තරම් රාජගුරුන්ගේ ගුණ නැණ බෙලයක් තිබුණා. ගණිතය අසමත් වුණු බාලිකාවන්ට වෙන් වුණු ඒ ඉස්කෝලෙට යනකොට නාමල්ගේ නම ශලිනි වෙලා තිබුණා. එතන නානාප්‍රකාර බාලිකාවෝ හිටියා. ගණිතය අසමත් වුණාට ඒ හුඟ දෙනෙක් සෞඛ්‍ය හොඳට හදාරලා තිබුණා. හුඟ දෙනෙක් ඉතිහාසය මතක් කරන්නවත් කැමති වුණේ නැහැ. තමන්ගේ ජීවිතයේ සියනෑ යුගයට කලින් තිබුණු කුරුණෑගල යුගය ගැන ඇත්ත එළි වෙයිද කියන සැකයෙන් ශලිනි මුල් කාලේ බෝඩිමේ කණ්ණාඩිය ඉස්සරහට වෙලා කල්පනා කළා. ඒත් මේ හැමෝගෙම රාජධානි එක එක හේතු මත නිරිත දිගට සංක්‍රමණය වෙලා තියෙන බවත් හැම දෙනාම රඟපාන බවත් තේරුම් ගියාම ඒ අපහසුව නැති වුණා. හැමෝම තමන්ගේ චරිතය රඟපාන්න මිසක් අනෙක් අයගේ රඟපෑම් වල අඩුපාඩු හොයන්න උත්සාහ කළේ නැහැ. ශලිනිගේ උකුල පළලින් අඩුයි කියන එක, නිශාලිගේ පපුව ලොකුයි කියන එක, උත්පලාට හීන් රැවුලක් තියෙන එක වගේ දේ වුණත් නොදැක්කා වගේ ඉන්න හැමෝටම පුළුවන් වුණා. ගම්පහ අනෙක් ඉස්කෝලවල කෙල්ලෝ දහම් පාසල් යන්න වගේ කොණ්ඩ කරල් දෙකක් ගොතලා කාමරංකා කූඩු වගේ ගවුම් අඳින කොට ශලිනිලා තනි කරලට කොණ්ඩේ ගොතලා, ඉණෙන් පහළට ගවුමේ පටිය බුරුල් කරගෙන පාරේ ඇවිද්දා. "ඒ ටිකම මදැයි" ශලිනි පිහ දාපු පත්තක් පැත්තකින් තියන ගමන් කල්පනා කළා.

ගම්පහ ජීවිතේ මතක් වෙනකොට හීල්ලෙන තරමට හරිම නිස්කලංකයි, සාමකාමීයි. බෝඩිමේ ඇන්ටිලා වුණත් ශලිනි ගැන පන්න පන්නා හොයන්න ගියේ නැහැ. මාස දෙකකට පාරක් ගමේ ගිහින් එන යොවුන් බෝඩිම් කාරිය ගෙනත් දෙන ඇපල් දොඩම් පාර්සල් එක ගැන එයාලා පැහැදුණා. "කුරුණෑගල පැත්තේ පළතුරු මුදලාලි කෙනෙක්ගේ දුවෙක්" වැඩිය කාමරේ නොරැඳෙන ශලිනි ගැන බෝඩිමේ ඇන්ටි ප්‍රශංසා මුඛයෙන් කතා කළා. ශලිනිත් පළතුරු ගේනකොට ඒවයේ දැවටිලා තියෙන කැවිලි, ආස්මි කෑලි එහෙම පිහිදලා ගේන්න තරම් කල්පනාකාරී වුණා. සාමන්‍ය පෙළ පටන් ගන්නකම් ඉංග්‍රීසි පන්තියකට යන්න තීරණය කරපු හැටි ශලිනිට අද වගේ මතකයි. "දැට්ස් ගුඩ් අයිඩියා" ඒ කාලේ නිතරම මුණ ගැහෙන ව්‍යාපාරිකයෙක් ඒ තීරණය ඇගයුවා. රාජගුරුන්ට ඇමතුමක් දුන්නාම පාඨමාලා ගාස්තුව ගිණුමට වැටුණා. කවුන්ටර් එකට නොගොහින් කාර්ඩ් එකෙන් සල්ලි ගන්න පුළුවන් නිසා හරිම ලේසියි.

"මූසල ගෑණි. මගේ ජීවිතේම කෑවා" ශලිනි ට බොරැල්ලේ ඉංග්‍රීසි ඇකඩමිය මතක් වෙනකොට දත් මිටි කැවුණා. මස් කපන පිහිය අතේ තියන් බංකුව උඩට කඩා වැටුණු ශලිනි ඒ දවස අසිහියෙන් වගේ මතක් කළා. ඔක්කොම ලියකියවිලි අරගෙන ඇකඩමියේ රෙජිස්ට්‍රාර් මැඩම් ළඟට ගියාම ඒ නෝනා ලියකියවිලි ටික පරීක්ෂා කරලා ශලිනි දිහා ඇස් දෙක නළලේ තියාගෙන බැලුවා. "මේ මොන විකාරයක්ද මේ !" ඒ ගෑණි ගේ කටහඬ ඇතුළේ

තිබුණු අප්පිරියාව ශලිනිගේ හිතේ තවමත් තැවරිලා තියෙනවා වගේ. ඒ අප්පිරියාව වැගිරෙන මූණ ආයේ දැක්කේ අද දවල් තිබුණේ දානේ ගෙදර දි. හැබැයි ඒ වෙනකොට ඒ මූණේ බය, කේන්තිය, අසරණකම ඔක්කොම තැවරිලා තිබුණා. "හොඳ වැඩේ මූසලී. උඹට ඔය වුණා මදි" ශලිනි කේන්තියෙන් හුස්ම ගත්තා.

"අයි.ඩී එකේ නම තියෙන්නේ නාමල් රංග කුමාර. මොනවද හලෝ මේ ඇඳගෙන ඉන්නේ" උන්දැගේ කටහඬ එච්චර සද්ද වෙනකොට ශලිනිට මොකක්දෝ හේතුවකට රාජගුරුව මතක් වුණා. "ගියාත්මේ ෂණ්ඩාර පූජා කරපු ඇත්තෝ ඔහොම තමයි" රාජගුරු හිටියා නම් එහෙම කියනවා.

ශලිනි තමන්ගේ අයදුම්පත්‍රය භාරගන්න කියලා වෙනත් මැඩම් කෙනෙක්ට ආයාචනා කරන ටිකට රෙජිස්ට්‍රාර් ගෑණි කීපදෙනෙක්ට කෝල් කළා. සුළු මොහොතකින් සත්තු වත්තේ චිම්පන්සි කූඩුව වටේ වගේ ඔෆිස් එකේ ජනේල් වලින් පවා සෙනඟ එබිලා බලන්න වුණා. හැමෝටම මේ අරුම පුදුම ජීවියා බලන්න ඕනේ වුණු අස්සේ අර ගෑණි ස්වේච්ඡාවෙන්ම ඒ අයට කතාව කිය කිය හිටියා.

එදා එතනින් පැනලා ආපු ශලිනිගේ ජීවිතේ වෙනස් වුණා. ඉගෙන ගන්න එක අමතක කරනවා කියලා තනි තීරණයකට ආපු ශලිනි ක්ලියෝපැට්‍රා එකේ ඉඳන් කතරගම පෙරහැර දක්වාම තමන්ට හිතෙන හිතෙන විදියට අඩිය තියන්න පුරුදු වුණා. රාජගුරුව සදහටම අමතක කරලා සැලූන් කීපයක්ම පහු කරලා ආපු මේ ගමන අන්තිමට නැවතෙන්නේ රාණි අක්කා ළඟින්. රාණි මුඛර්ජි වගේ කියලා ඒ කාලේ නම දාගත්තට රාණිට දැන් වයසයි. පෙරහැරවල් වල නටන්න බැරි නිසා එයා තමන්ට පුළුවන් කෑම උයන වැඩේට අත ගැහුවා. කෙටි කාලෙකින් රාණිගේ කෑම ජනප්‍රිය වුණු නිසාම ශලිනිටත් අතවැසිකමක් ලැබුණා. එච්චර කල් කීකරු ගෝලයෙක් වෙලා හිටිය ශලිනි මේ උයන දානේ ගෙදර අයිති කාටද කියලා දැනගත්තාම කවදාවත් නැතිව මුරණ්ඩු වුණා. රී-ලෝඩ් එකක් දාන්න යනවා කියලා එළියට පැනලා ෆාමසි එකෙන් ගෙනාපු විරේක පෙති ටික කෑමට දැම්මේ ඒකේ ප්‍රතිඵලය නොදැන නෙමෙයි. දානේ ගෙදර අමුත්තන්ට බඩ යන්න ගත්තාම ශලිනි හොරෙන්ම මාරු වුණා.

ඒත් හැමදාටම වහන් වෙලා ඉන්න බැහැ. ශලිනි ඒක අත්දැකීමෙන්ම දන්නවා.

*උපුටාගැනීම - https://sahankaseera.blogspot.com/2017/08/blog-post_21.html?m=1*
*පින්තූරය - http://wallpapersin4k.net/ - http://saharfadaian.com*

## සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙකු වීම යනු කුමක් ද?

සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙකු යනු උපතේ දී තමාට හිමි වූ ලිංගික භාවයට අනුරූප නොවන ලිංගික අනන්‍යතාවක් තහවුරු කරන හෝ ප්‍රකාශයට පත් කරන පුද්ගලයෙකි. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් අතරට නිශ්චිත පුරුෂ හෝ ස්ත්‍රී අනන්‍යතාවක් පළ නොකරන, මධ්‍යස්ථ ලිංගික සහ/හෝ මුක්ත ලිංගික පුද්ගලයෝ ද ඇතුළත් වෙති.

සංක්‍රාන්ති ලිංගික පුද්ගලයෙකු යනු විරුද්ධ ලිංගය සමග මානසිකව අනන්‍ය වන්නා වූත් ඇතැම් විට විශේෂයෙන් ම අවශ්‍ය කායික පෙනුම ලබා ගැනීම සඳහා (බාහිර ලිංගික අවයව වෙනස් කිරීම වැනි) සැත්කම් සහ හෝමෝන ප්‍රතිකාර කර ගැනීම මගින් විරුද්ධ ලිංගයේ සාමාජිකයෙකු ලෙස ජීවත් වීමට උත්සාහ කරන්නා වූත් පුද්ගලයෙකි.

විරුද්ධ ලිංගික ඇඳුම් අඳින්නන් යනු වෙනත් ලිංගයකට අයත් ඇඳුම් ඇඳීමට කැමැත්තක් දක්වන නමුත් තමන් වෙනත් ලිංගයකට අයත් යැයි හඳුන්වා නොගන්නා පුද්ගලයන් ය.

ඔබ මෙම නිර්වචනවලින් එකකට හෝ වැඩි ගණනකට අයත් විය හැකි ය, නැති නම් ඉන් කිසිවකට අයත් නො විය හැකි ය. කඩිමුඩියේ මේ දැන් හෝ කිසි දිනෙක හෝ ඔබ ලේබල් කර ගැනීමේ අවශ්‍යතාවක් නැති අතර සමහර අය තමන් විසින් තමන් දැක ගන්නා ආකාරය වඩා නිශ්චිතව ප්‍රකාශයට පත් වන විවිධ ලේබල් තෝරා ගනිති.



## මම සාමාන්‍ය පුද්ගලයෙක්ද?

සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙකු ලෙස ජීවත් වීම ජීවමානව සිටීම තරම් ම සාමාන්‍ය දෙයකි. තමන් සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් යැයි ඉතිහාසය පුරා ම විවිධ පුද්ගලයන්ට හැඟී ඇත. සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෝ හැම තැන ම සිටිති. ඔවුන් අතර ගුරුවරුන්, වෛද්‍යවරුන්, ඉදි කිරීම් කම්කරුවන්, වේටර්වරුන් යන ඕනෑ ම කෙනෙකු සිටිය හැකි යි. ඔවුහු පාසල් යති, විශ්ව විද්‍යාලවලට යති, රැකියා කරති.

ඔබට වෙනත් සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයන් දිනපතා හමු වන නමුත් ඔබ ඒ බව නොදන්නෙහි ය! සංක්‍රාන්තික සමාජභාවී පුද්ගලයෙකු වීම "සාමාන්‍ය තත්ත්වයක්" නොවන නිසා ඔබ ගැන හරිහැටි තේරුම් නොගන්නා හෝ ඔබ නිසා අපහසුවක් දැනී ඔබට වෙනස්කම් පවා කරන පුද්ගලයන් ඔබට හමු විය හැකි බව නිසැක ය. කෙසේ වෙතත් ඔබ නිසැකව ම සාමාන්‍ය පුද්ගලයෙකි!

# සංචාරක සටහන




*සටහන සහ ඡායාරූපකරණය - හිරාන් හේමන්ත*

ඇමසන් වනය බිහිවූ කාලපරාසය තුළ බිහිවූවා යැයි සැලකෙන ඇමසන් වනයේ බීජ පිටපතක් ලෙස සිංහරාජ වනය සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම නිවර්තන තෙත් සදා හරිත වනාන්තරය වන සිංහරාජය වර්තමාන අපට ලෝක උරුමයකි. ලංකාවේ තිබෙන එකම ස්වාභාවික ලෝක උරුමයද සිංහරාජය වේ. හෙළයේ විසූ අවසන් සිංහයා තම ආධිපත්‍යය පතුරුවමින් වාසය කළ මහා වනය සිංහරාජය ලෙසත්, සිංහයා ජීවත්වූ ප්‍රදේශය සිංහගල ලෙසත්, සිංහයා වාසය කළ ගුහාව සිංහ ගුහාව ලෙසත් අදටත් ජන ව්‍යවහාරයේ ප්‍රසිද්ධය.


සිංහරාජයට ඇතුළුවීම සඳහා ප්‍රධාන මාර්ග හතරකි. කලවාන වැද්දාගල මාර්ගය, රක්වාන මෝනිං සයිඩ් මාර්ගය, හිනිඳුම නෙළුව මාර්ගය හා දෙනියාය පල්ලේගම මාර්ග නම් ඒවාය. ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රිකයන්හි පැතිරී පවතින සිංහරාජයේ විශාලත්වය හෙක්ටයාර 11,187 ක් පමණ වේ. වාර්ෂිකව මිලි මීටර 3000 ත් 5000 ත් අතර වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් සිංහරාජයට වියළි කාලගුණ සමයක් නොමැති තරම්ය. අවම වර්ෂාපතනයක් ලැබෙන පෙබරවාරි මාසයේ පවා මිලි මීටර 180 ත් 200 ත් අතර වැසි ප්‍රමාණයක් සිංහරාජයට පතිත වේ. එබැවින් සිංහරාජය තෙත් සදා හරිත වනාන්තරයක් බව අපට නිසැකව හැඟීයයි.



දකුණු දිශාවෙන් ගලා බසින ගිං ගඟත්, උතුරු දිශාවෙන් ගලා බසින කළු ගඟත් සිංහරාජය වැසි ජලයෙන් පෝෂණය කරන ප්‍රධානතම ගංගා දෙකයි. මෙම ගංගා වලට අමතරව නාපොළ දොළ, කළුකන්දාව ඇළ, මහ දොළ, කොස්ගුලන ගඟ, පිටකැලේ ගඟ යන ගංගා සහ කුඩව ප්‍රදේශයේ පිහිටා ඇති දුහුවිලි ඇල්ල, දූලි ඇල්ල, බ්‍රාහ්මණ ඇල්ල, ඌරා වැටුණු ඇල්ල යන දිය ඇලි ගහනය වනයේ සදාහරිතභාවය ආරක්ෂාකරමින් සිංහරාජය සුන්දරත්වයෙන් පෝෂනය කරයි.

උඩු වියන් ස්ථරය, උප වියන් ස්ථරය, යටි ස්ථරය, පඳුරු ස්ථරය හා ආරෝහ ශාක සහ කඳක් නොමැති ශාක යනුවෙන් කොටස් වශයෙන් පැහැදිලිව වෙන් කළ හැකි ස්ථර පහකට විහිදුණු ශාක ප්‍රජාවන් සිංහරාජ වනයේ පවතී. මෙම ස්ථරයන් අතර ප්‍රධාන වශයෙන් දැකිය හැකි ශාක රැසක් ලංකාවට ආවේණික වීම තවත් විශේෂත්වයකී.



සිංහරාජය හරහා ලංකාගම දක්වා හා සංචාරකයින් ගමන්ගන්නා මාර්ගයන් අවට කැහිබෙල්ලා, සුදු ශාරිකාවා, හිස අළු දෙමළිච්චා, බට ඇටිකුකුළා යන පක්ෂීන් ද, විශාලතම කටුස්සා වන කරමල් බෝදිලිමා, පුංචි අං කටුස්සා(කැන්ගරු කටුස්සා), පළා පොළගා, ගැට පොළගා, ඇහැටුල්ලා වැනි උරගයින්ද, ඕලු මුවා, කලු වඳුරා ඇතුළු නොයෙකුත් ක්ෂීරපායී සත්වයන්ගෙන් ද, විවිධ කෘමී විශේෂ හා ජලාශ්‍රිත ප්‍රදේශ වල ජීවත්වන තල්කොස්සා, දම්කොළ සාලයා, මඟුරා, ලේ තිත්තයා, බුලත් හපයා, ගල් පාඩියා, වයිරං අහිරාවා, කොළ කනයා යන මත්ස්‍යය විශේෂ ද සිංහරාජය තුළ නිරන්තරයෙන් ඔබට දැකගත හැකිය.







සිංහරාජය තුළ අලි ඇතුන් බහුලව සිටි බව අවට ගම්වාසීහු පැවසු අතර වනාන්තරය තුළ අලි ඇතුන් වාසය කර ඇති බවට සාක්ෂි ඇති මුත් මේ වනවිට මොවුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ ගොස් ඇත. දිවියා, ගෝනා, ඕලු මුවා, මී මින්නා, දඩු ලේනා, කොළ දිවියා ඇතුළු අතිවිශාල සත්ව ප්‍රජාවකගේ වාස භූමිය ලෙස සිංහරාජය හැඳින්විය හැකිය. ලංකාවට ආවේණික වු ක්ෂීරපායී විශේෂ 12 න් 08 ක් වාර්තාවී ඇත්තේ සිංහරාජය තුළිනි. පක්ෂි විශේෂ 160 ක් පමණ වාසය කරන සිංහරාජ වනයේ ලංකාවට පමණක් ආවේණික පක්ෂි විශේෂ 18ක් ඔබට දැකගත හැකිය. කැහිබෙල්ලා, සුදු ශාරිකාවා, හිස අළු දෙමළිච්චා, බට ඇටිකුකුළා, සිතාසියා, පතිගෝමර තිරාසිකයා ඒ අතරින් විශේෂ කිහිපයකි. විශේෂ වර්ග 45 කට අයත් උරගයින් අතර විශේෂ 21 ක් ම ලංකාවට අවේණිකයින් ය. අතිශය දුර්ලභ උභයජීවී විශේෂ 50ක්, මිරිදිය මත්ස්‍ය විශේෂ 20 ක් හා සමණළ විශේෂ 65 ක් ද සිංහරාජ වනාන්නරයෙන් අපට වාර්තා වේ.





1988 වසර තුල ලෝක උරුමයක් ලෙස නම් කළ හෙළයේ මහා උරුමය රැකගැනීම, ආරක්ෂා කිරීම හා ආදරය කිරීම අප කාගේත් යුතුකම හා වගකීම බව අප අමතක නොකල යුතු ය.







### කඳවුරු බිම් සහ නවාතැන් වෙන්කිරීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා/ කඳවුරු බිම් වෙන්කිරීම බත්තරමුල්ලේ, රජමල්වත්ත පාරේ සම්පත්පාය පරිශ්‍රයේ පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය මඟින් පමණක් සිදුකරයි. මේ සඳහා වන ඉල්ලීම් සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉදිරිපත් කළයුතුය.

දුරකථන අංක +94 11 2866631, +94 11 2866632, +94 11 2875540 අදාල අංශය -වන සංගණන හා කලමනාකරණ අංශය

වැඩිදුර තොරතුරු සඳහා අමතන්න. දිසා වන නිලධාරී, දිසා වන කාර්යාලය, රත්නපුර, දුරකථන අංක : (045) 2222171 දිසා වන නිලධාරී, දිසා වන කාර්යාලය, ගාල්ල, දුරකථන අංක : (091) 2234306



# THE PANSY project



Paul Harfleet, a London based artist, plants pansies at sites of homophobic abuse. The flower is photographed once it's planted and posted on his website, The Pansy Project, with a title/caption after the abuse that took place in that location. Harfleet began planting pansies to mark his own experience of homophobia on the streets of Manchester, now he plants pansies for others.

It all began in Manchester where Harfleet was raised into an accepting home, but a very homophobic environment where homophobic gangs started throwing stones at his then boyfriend. Though he had become accustomed to this type of abusive behaviour, Harfleet soon realised his friends had disagreed and encouraged him to begin to resist this type of violent behaviour towards homosexuals. In order to change the way he felt about the locations and the memories connected to it, he began planting pansies at those locations, the same way people place flowers at a scene of crime or accident.

Harfleet chose this species of plant in particular because the word in itself refers to a gay man. It also originates from the French verb: pensar (to think) as the flower was seen to have a bowing head which seemed to portray a person in deep thought. Harfleet said: "Planting them really did become transformative- it changed the way I felt about the location. When they become associated with resistance to something like a hate crime, they become powerful. It was a simple and peaceful way of confronting homophobia."





"C'est Degueulasse!" Mont Parnasse, Paris, France 2015.
Planted during the filming of 'Les Pensees de Paul'.



"Schwein!" Graffiti on an LGBT poster, CERN, Geneva



"They took me to the public toilets, punched my teeth out and raped me"
Promenade,Derrière-Bourg, Lausanne, Switzerland. 2016.

Paul Harfleet has planted pansies all around the world starting in Manchester, his home town, working his way around London and the UK and into countries like Switzerland, France, Sweden, Belgium, Austria, Germany, USA, Turkey and South Africa. Harfleet plans to travel the world further and plant pansies in more challenging locations.

Pansy Boy, a picture book, written and illustrated by Paul Harfleet launched this summer (2017). Told in rhyming couplets, it is the story about a boy who loves to draw, read and write, who's obsessed with planes, art and the world around him. But when he returns to school, it's a complete different story as he faces bullying and homophobia. It will be available in bookstores in the UK from this summer.

All in all, The Pansy Project will continue to expand and help people to face up to homophobia. Harfleet adds: "I hope that people who hear about the project who then go on to experience homophobia may remember the project. In this case, the project becomes a mental strategy for experiencing homophobia on the streets." You can support Paul Harfleet's work by checking out his website for the Pansy Project http://www.thepansyproject.com, his Facebook page https://www.fb.com/pansyproject/, or Twitter page at @ThePansyProject.









- ප්‍රසාද් ලක්මාල්

# සම බිමක් කරා එකම මාවතක

"පොදු හෝ විශේෂිත අරමුණක් අතැතිව සමාජ හා සංස්කෘතික පර්යායෙහි නව වෙනසක් හෝ පවතින තත්වය එපරිදිම පවත්වාගෙන යාමට පෙළ ගැසුණු සාමූහික ක්‍රියාකාරකම් මාලාවක් ලෙස" (Surana Pushpendra, 2001) සරලවම හදුනාගත හැකි සමාජ ව්‍යාපාරයක් යන්න ප්‍රජාතන්ත්‍රීකරණය, සමානාත්මතාවය හා පුරවැසිභාවය යන සංකල්ප බිහිවීම හරහා ඒවායෙහි හැඩයෙහි යම් වෙනස්කම් සිදුවෙමින් විකාශනය වි ඇත.

LGBTIQ අයිතිවාසිකම් වෙනුවෙන් සමාජ ව්‍යාපාර ඇමෙරිකාවෙන් ඇරඹීය. එනම් 1924 දී මානව අයිතීන් සඳහා සමාජ ජාලයක් චිකාගෝ වල පිහිටුවීමෙන් අනතුරුවයි. මිත්‍රත්වය හා නිදහස ලිංගික සුළුතරයින් සඳහා ලබාගැනීම එහි අරමුණ වි ඇත. මෙම ජාලගතවීම සිදුවූවත් LGBTIQ විරෝධතා සක්‍රියව ආරම්භ වී ඇත්තේ වර්ෂ 1969 ජුනි මස 28 දී ඇමෙරිකාවේ "Stonewall" නම් සමරිසි සමාජ ශාලාවෙහි ඇතිවූ සිද්ධියෙන් අනතුරුවයි. මෙම සිද්ධිය සමඟ ඇමෙරිකාව තුළ LGBTIQ ප්‍රජාවගේ අයිතීන් සඳහා වූ සමාජ ව්‍යාපාර ආරම්භය හා ඒවාහි ව්‍යාප්තිය විවිධ ප්‍රාන්ත හා නගර කේන්ද්‍රකොටගෙන පවත්වන්නට විය. එහි ප්‍රතිපලයක් ලෙස සමරිසි පිරිමින්ට ඡන්ද අයිතිය ඇමෙරිකාව තුළ ස්ථාපිත වීම හා සමරිසි ප්‍රජාව කෙරෙහි යම් සංවේදී දෘෂ්ටියක පිහිටා කටයුතු කරන ස්වරූපයක් අනෙකුත් රාජ්‍යයන් තුළ ද දක්නට ලැබුණි.

LGBTIQ සමාජ ව්‍යාපාරවල ඉතිහාසය පිළිබඳව ගවේෂණයේදී 19 වන සියවසට පෙරාතුව දැකගත හැකි වූ අතර 1870 එනම් වික්ටෝරියානු යුගය තුළදී මේ පිළිබඳව අවධානය යොමුවෙමින් ප්‍රජාව කෙරෙහි සමාජ ආකල්පය ධනාත්මකව හැඩගැස්සවීමට එකී ව්‍යාපාර යම් බලපෑමක් කොට ඇති බව කිව හැකිය. එහිදී යුරෝපීය හා ඇමෙරිකා ඉතිහාසයේදී 1950 හා 1960 දශකවලදී සංස්කෘතික සුළුතරයින් ලෙස හදුනාගන්නා මෙම ප්‍රජාවගේ ව්‍යාපාර වර්ධනීය යුගයකට පැමිණ ඇති බවත් සිවිල් අයිතීන් ප්‍රමුඛකොටගෙන සමලිංගික විමුක්ති ව්‍යාපාර ආරම්භ වීමත් 1980 සිට අද වනවිට මෙම ලිංගික සුළුතරයින්ගේ සමාජ ව්‍යාපාරවල වර්ධනය සමස්ත ලෝකය පුරා දැකගත හැක. නමුත් මේ අවධියෙහි මිනිසාගේ ලිංගික චර්යාව හදුනාගැනීමට යම් උත්සහයක් දරා ඇති බව කිව යුතුය. ඩංගන් ප්‍රොසිච් විසින් සමලිංගිකත්වය යනු අසනීපක්/රෝගයක් හෝ අපරාධයක් නොවන බව මෙකළ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සමාජ ආකල්පයෙහි යම් වෙනසක් ඉන් ඇතිව තිබේ. World Economic Forum මගින් ඉදිරිපත්කරන ආකාරයට ලෝකයේ රාජ්‍යයන් 23 ක සමරිසි විවාහ නෛතිකව පිළිගනී. එලෙස සමලිංගික විවාහ නෛතිකව පිළිගන්නා සහ LGBTIQ මිතුරු රාජ්‍යය ලෙස ඇමෙරිකාව, දකුණු අප්‍රිකාව, නවසීලන්තය, බ්‍රිතාන්‍ය, නෙදර්ලන්තය, ස්පාඤ්ඤය, කැනඩාව, බෙල්ජියම, නෝර්වේ, ලක්සම්බර්ග්, උරුගුවේ, ස්වීඩනය, අයර්ලන්තය, සහ ඩෙන්මාර්කය වැනි රාජ්‍යයන් සදහන් කළ හැකිය.

ලිංගික සුළුතරයින් ලෙස සමාජයෙහි හදුන්වා ගන්නා මෙම LGBTIQ ප්‍රජාව විවිධ ලිංගික දිශානති හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතා මත පදනම් කරගෙන තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට උත්සහ දරන පිරිසක් ලෙස හැඳින්විය හැකිය. නමුත් විෂම ලිංගිකයින්ගේ චර්යා හා විෂම ලිංගිකවාදි අදහස්, සමලිංගික භීතිකාව, සංක්‍රාන්තික ලිංගික භීතිකාව, ද්විලිංගික භීතිකාව හෝ වෙනත් හේතු නිසා මෙම ප්‍රජාව කෙරෙහි පවතින සමාජ ආකල්පය විවේචනාත්ම ස්වරූපයක් ගනු ලැබේ. LGBTIQ ප්‍රජාව යනු සමාජ සම්මතයෙන් එහා ගිය පිරිසක් ලෙස සමාජ බහුතරය හදුන්වාගනිති. ඔවුන්ගේ විවිධ ලිංගික දිශානති සමාජය විසින් තවත් එක් සංසිද්ධියක් ලෙස තේරුම්ගෙන නොමැත. විවිධ ප්‍රචණ්ඩකාරී ක්‍රියාකලාපවලට මුහුණ දෙන මෙම ප්‍රජාව මූලික මානව අයිතීන් වලට ප්‍රවේශවීමේ හැකියාව අවමය. එයට පවතින බාධාව වන්නේ සමාජ, දේශපාලන ප්‍රපංචවල හැසිරීමයි. සිවිල් සමාජයෙහි ආකල්පය ඔවුන්ගේ පොදු සමාජ අනන්‍යතාව ගොඩ නඟාගැනීමට වැදගත් වෙයි. සමාජ ව්‍යාපාර හරහා යම් බලපෑමක් සමාජ ආකල්ප වෙනස් කිරීමට දායක වන බව කිව හැකිය. ලිංගික සුළුතරයින්ගේ මානව අයිතීන් කඩවීම්වලට අදාළව ඔවුන් විසින් විවිධ සමාජ ව්‍යාපාර දියත් කරන බවත් එකී ව්‍යාපාර සදහා විවිධ

පාත්‍රයන්ගේ සහයෝගය ලැබීමත් සමඟ ජාත්‍යන්තරික වශයෙන් ඔවුන්ගේ මානව හිමිකම් ආරක්ෂණයට එක්සත් ජාතින්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන ව්‍යුහය කැපී පෙනෙන භූමිකාවන් රඟ දක්වනු ලැබේ. නමුත් ඒවායෙහි ප්‍රායෝගිකභාවයත් කාලානුරූපීව වෙනස්වීම දක්නට නොලැබේ. පොදු සමාජය තුළ ලිංගික සුළුතරයින්ගේ මානව අයිතීන් හා සමලිංගිකත්වය පිළිබඳව පවත්නා දුර්මතයන් ඔවුන්ගේ පොදු සමාජ අනන්‍යතාව ගොඩනගා ගැනීමෙහිලා පවතින එක් බාධකයකි. සමලිංගිකත්වය අපරාධයක් හා අපගාමී චර්යාවක් ලෙස සමාජයෙහි ආකල්ප පවතී. නූතනයේදී මොවුන්ගේ පොදු අනන්‍යතාවල නෛතික වෙනස්කම් හා දේශපාලන අවශ්‍යතා සඳහා සාමූහික ක්‍රියාකාරකම් මත පදනම් වූ ශක්තිමත් අරගල බහුතර රාජ්‍යයන්හි දැකගත හැකිය.




**සමසැලකුම් හමුවේ නිදහසේ ජීවත්වීමට දිනක් උදා වෙතැයි ඔවුහු අපේක්ෂාවෙන් දෑස් දල්වා සිටිති. නමුත් සැමට අමතක වී ඇති කාරණය නම් මෙම ප්‍රජාව ද සමස්ත මානව කුලකයටම අයත් වන අතර ඔවුන්ද නිදහස්ව මිනිසුන් ලෙස ඉපිද ඇති නිසා මූලික අයිතීන් ලැබීමේ වරප්‍රසාදය ඔවුන්ටද හිමිවිය යුතුය යන්නයි...**




සමලිංගිකත්වය පිළිනොගන්නා රාජ්‍යයන් ජාත්‍යන්තර පද්ධතිය තුළ දැකගත හැකි අතර එකී සෑම රාජ්‍යයකම පාහේ අභ්‍යන්තර වශයෙන් සැඟවුණු හා ප්‍රසිද්ධව පවතින යම් යම් සාමූහික ක්‍රියාකාරකම් ලිංගික සුළුතරයින් විසින් ගෙන යනු ලැබේ. එකී ව්‍යාපාර හරහා පොදු සමාජ අනන්‍යතාව ගොඩ නගා ගැනීමට මෙම පිරිස යම් උත්සාහයක නියැලෙන අතර සමාජය ව්‍යුහයෙහි පවතින තත්වයෙහි යම් වෙනසක් හෝ පවතින ව්‍යුහය තුළම එය ප්‍රතිව්‍යුහගතකරන ක්‍රියාවලියක් ඔවුන් අපේක්ෂා කෙරේ. පුළුල් ව මෙම ලිංගික සුළුතරයින් පිළිබඳව සාකච්ඡා කිරීම් සමාජයෙහි දැකගත හැකිවන අතර එහිදී යම් කතිකාවතක් දකුණු ආසියානු කලාපවල සමලිංගිකත්වය පිළිබදව ඇති බවත් ඒ කෙරෙහි පවතින දැඩිමතවාදය එහිදී කැපී පෙනේ. තත්වය එසේ වුවත් ලිංගික සුළුතරයින්ගේ මානව හිමිකම් සුරක්ෂණය සඳහා යෝග්‍යාකාර්ටා මූලධර්ම දැනට පවතින ප්‍රබලම යාන්ත්‍රණයකි. එය ගුරු කොටගනිමින් ලිංගික සුළුතරයින්ගේ නැගීසිටීම හා විවිධ සංවිධානගතවීම් දැකගත හැකිය. නමුත් සමාජ රෝග ව්‍යාප්තියෙහි වාහකයන් ලෙසට මෙම ප්‍රජාව හදුනාගැනීම නිසාවෙන් ඔවුන් කෙරෙහි සමාජ දෘෂ්ටිය යම් අව මට්ටමක පැවතීම දක්නට ලැබේ. ලිංගික සුළුතයින්ගේ අයිතීන් දිනාගැනීමට ලෝකය පුරාම අයිතිවාසිකම් ව්‍යාපාර සිදු කෙරේ. ඒවායෙහි මූලික හරය ලෙස අයිතීන් දිනාගැනීම හා පවතින සමාජ ආකල්පයට ඉන් යම් බලපැමක් සිදු කෙරෙයි. එහිදී ලිංගික සුළුතරයින්ගේ මානව අයිතින් දිනාගැනීම සඳහා ඔවුන් විසින් දියත් කරන සමාජ ව්‍යාපාර ඔස්සේ ඔවුන්ගේ පොදු අනන්‍යතාව ගොඩ නගා ගැනීමට සාධනීය බලපෑමක් ඇති වීම සාධනය කළ හැකිය.

නමුත් මෙම වෙනස සිදුවීමට හා සිදුකිරීමට විවිධ බාධා පවතියි. මන්ද තවමත් මෙම ලිංගික සුළුතර ප්‍රජාව කෙරෙහි පවතින සමාජ ආකල්පය තුළ විවිධ අසමානකොට සැලකීම් පවතින නිසාවෙනි. සමසැලකුම් හමුවේ නිදහසේ ජීවත්වීමට දිනක් උදා වෙතැයි ඔවුහු අපේක්ෂාවෙන් දෑස් දල්වා සිටිති. නමුත් සැමට අමතක වී ඇති කාරණය නම් මෙම ප්‍රජාව ද සමස්ත මානව කුලකයටම අයත් වන අතර ඔවුන්ද නිදහස්ව මිනිසුන් ලෙස ඉපිද ඇති නිසා මූලික අයිතීන් ලැබීමේ වරප්‍රසාදය ඔවුන්ටද හිමිවිය යුතුය යන්නයි. එසේ නොවන්නේ නම් එය සමානාත්මතාවයෙහි ප්‍රායෝගිකභාවය යන්න විවේචනයට ලක්වන්නේය.

# a life less ordinary

By - Sriyal Nilanka

A collaborative effort by Tanya Warnakulasuriya and Udhara de Silva brings out inspiring home-grown stories of well-known personalities, placing Sri Lankan lives on the world map.


Udhara

For many Sri Lankans, it is a difficult task to find inspiring stories within our country, not due to the shortage of stories but rather, due to those stories not being told in a widely available medium. 'A Life Less Ordinary' attempts to grapple with this shortage by showcasing a podcast series that can be accessed by anyone, from anywhere.

If you feel like you are in the wrong place at the wrong time, unable to find the motivation to follow your dreams, this podcast series is sure to inspire you.

Tanya currently works as the Arts Manager for the British Council Colombo and previously managed the global operations at BBC News for over 15 years. Udhara is a creative consultant who is involved in advertising and digital marketing.

Their shared interest in telling inspiring stories led them to venture out on a joint project to showcase Sri Lankan role models who have achieved the unthinkable in their own right.


Tanya

As with most cases, the media tends to build a certain image about a person and that is in itself magical and necessary for promotional purposes, yet the deconstruction of how these well-known figures achieve the unimaginable is another art in itself.


The creators of this series of podcasts have sought out to bring about just that. Tanya and Udhara want to bring about the human aspect to these well-known personalities thus making their stories more relatable to anyone listening to them.

Each individual story on the show takes an unexpected twist but they will continue to inspire you nonetheless, Udhara and Tanya promise. The guests' shared appetite for life, their tenacity, the discipline in achieving their goals and the of lack of bitterness towards those who have been against them has been the primary lesson for the creators.


Members of the Lankan LGBTIQ community in particular don't have many role models look up to, yet we can take guidance in the stories of other Sri Lankans who have achieved their goals against insurmountable odds.

We have all often felt alienated in our journeys, bogged by social expectations and our own prejudices but as Udhara puts it "If you can break free from the limitations that have been placed on you and reinforced by yourself, you can do anything you want. You really can."

A Life Less Ordinary will premiere on the 1st September 2017. You can download A Life Less Ordinary on the iOS App, Android App or their website www.lifelessordinary.asia





The 8th edition of the KASHISH Mumbai International Queer Film Festival was held from the 24-28th of May under the direction of Sridhar Rangayan. The festival was hosted under the theme "Diverse, One" which delves deep into the lives of LGBTIQ lives, exploring the diversity that unites us in the trials and tribulations we face as a community.

The festival screened a total number of 147 films from 45 countries debuting films from countries such as Armenia, Nigeria, Kosovo, Rwanda, UAE, Trinidad & Tobago and Aruba.

Here are some of the movies that truly made a mark in the schedule.

Source: mumbaiqueerfest.com / www.thehindu.com

## Signature Move



Signature Move, USA
Director: Jennifer Reeder

Signature Move is the story of Zaynab, an American Muslim lesbian, who hides two things from her homebound, conservative mother Parveen: her budding relationship with a Mexican-American woman Alma and her growing fascination with wrestling! It's a beautiful rendition of a journey in search of an identity.

## Chronicles of Hari



Chronicles of Hari, INDIA
Director Ananya Kasaravalli

It is a beautiful story of a man who made a mark in performing the female parts in Yakshagana theatre and the struggle he faced when he deciding to take the part out of the stage.

## Only Men Go to the Grave




Only Men Go to the Grave, UAE
Director: Abdulla Alkaabi

A mother welcomes her estranged daughters to tell them a secret. Unfortunately, she accidentally dies while sharing it. During the funeral, the daughters try to deal with their mother's sudden death and also work together to unveil her secret by looking for clues from visitors while unravelling their own lives.

## WHITE NIGHTS (Velutha Rathrikal)

WHITE NIGHTS (Velutha Rathrikal)
Director: Razi Muhammed

A local and contemporary adaptation of the eponymous novel by Fyodor Dostoyevsky, White Nights follows the lives of Manu, Jyoti and Chelly as the movie unravels the dilemma of Chelly and her bisexual love triangle.







## Two Soft Things, Two Hard Things

Two Soft Things, Two Hard Things, CANADA
Directors: Mark Kenneth Woods and Michael Yerxa

This documentary explores the complexities of a remote Arctic community holding an LGBTQ pride celebration.





## බෝඩිංකාර සමරිසියෙකුගේ වියපත් ප්‍රේමය...

..........
දෑස් ඇර බැලීමි.
කුට්ටි කර දමා තිබූ අන්ධකාරය
ඇස්බෝලවලට තල්ලු විය.
පපුව වේගයෙන් උස් වුවද
පහත් වූයේ සෙමිනි.
වම් තනයට යටින්
හීන් රිදුමක් තිබුණි.
හිස් මුදුනේ සිට
පහළට ගලා විත් තිබුණු දහඩිය
නිරුවත් තට්ටම තෙත් කර තිබුණි.
යටි බඩ කොරවෙමින්
මූත්‍රා පිටවනු
තදටම දැනුණි.
අසීරුවෙන් උස්සාගත්
වම් අත දිග ඇර
පුරුද්දට මෙන්
ඔහු සිටිනාවාදැයි බැලීමි.
එකෝමත් එක කාලෙක
උනුහුමට තුරුල්වුණ
වම්පස තනිරැක්ක
ඔහු
සිහිනයෙන් ඇවිත්
මොට්ටවුණු පිහිතුඩින්
හදවත හාරනු දැනිනි.

- තුෂාර මනෝජ්



## එකම එක තත්පරයක්

හිත ගාව දඟ කරපු
නෙත ගාව නිති රැඳුනු
හීන සිතුවම් කරපු
දුරයි නුඹ ළඟ රැදුනු
හැමදාම මා
හොයන..
මගේ උණුහුමට
මට හොරෙන්
තුරුළු වී..
හුරතලෙන්..
දවසෙම එකතු උන
විඩාවට තිත තියන
කුරුල්ලෙක්
උන්නා මටත්..
හීන ලොවකට
මඟ කියපු..
සොඳුරු හිනාවකට
පුළුවන් බව
ජීවත් වෙන්න
ආසාවක් ඇති කරන්නට
තව එක තත්පරයක්
එකම එක තත්පරයක්
කියා දුන් ඒ
කුරුල්ලාගේ හිනාවම
තමයි..
හේතුව
මේ වැටෙන
හැම හුස්මටම..

- ප්‍රදීප් නිශාන්ත
ලක්මාල්



## මා පියඹ.....

මා පියඹ නෙත් සඟළ නොවේ දිවයුරුට සම
පබළ රත තරම් නැත ඇගේ ලවනතෙහි රත...
ඉදින් හිම සුදු වුවත් ඈ ළමැද පඬු පැහැය..,
මුහුලස ද තත් වැනිය කළු පැහැති සිරස මත
දැක ඇත ද රෝස මල් පැහැය යුතු රතු ද සුදු
එවන් වූ රෝස මල් නොමැති ඈ දෙකොපුල...

ඇතද නෙක විලවුන් ගඳින් කුල්මත් කරන
මා පියඹ සුසුම රැදි දුර්සුවඳ පරදවන..........

- දුමිඳු






## කලුවර ඇවිදින්...

නුඹ ගිය දවසෙ ඇද හැලුණු මහ වැස්ස දැන් අවසන්ය
තුරු පත් අග ඉතුරුව තිබුණු අන්තිම දිය බින්දුවත් දැන් වියළිය
ඉරත් පායා දැන් බැස ගොසින් යළිත් කලුවර ඇවිදින්ය
කලුවරත් අද වියළිය
පුංචිම පුංචි තරු එළියක් වගෙයි
පුංචිම පුංචි ගිනි දළුවක් වගෙයි
වියළි අහසේ කළුවර තුළින්,
පුංචි කලුවර ඇස් දෙකක්
අහස මැද්දෙන් මට පෙනෙයි
නිහඬවම බලාගෙන මා දිහා
ආදරය යනු පාළුව
ඔබ නැති වෙලාවට හිතෙන එක
ළඟ හිටියා නම් කියා ඔබ
තුරුළු වී පපුවට
මෝඩ කතාවක් කිය කිය...

- දමිත් චන්දිමාල්



## එකම ආදරයක්... එකම ජීවිතයක්...


ඔබත් මාත් අතර
තිබුනේ නැද්ද ආදරයක්...
ආදරෙයි ආදරෙයි කියා
රැවටුවාද ජීවිතයක්...
දෙන්නට බැරි ආදරයක්
පොරොන්දු වී මහා මෙරක්...
අතැර ගියේ ඇයි මෙලෙසින්
හීන හීනයක් කරමින්...

- අර්මුක් අකලිත්ටි











## Memory...

The long dungeon of memory,
Where childhood stares at you;
Unblinking,
Nudging you never to forget
Those shameful memories
You'd tucked in tight.

He looks at you as at a mirror,
Observing the little flaws to mourn about,
Complain about and throw a tantrum about.

The slender path of absolute bliss,
Winding and winding and winding -
Unending.

At the barricade, the policemen stop,
to check the blood on your hands.
The sweet blood of a battering,
you shouldn't have gone through,
But they made you go through anyway.
You sat there behind the bars of life and rule,
You pondered on your doings.

There again you saw the tall gates of expectation,
The silence, the obedience, the tolerance.
The corroded padlock,
digging through your wrists, like the crucified.
The thick red fountain oozing from your veins,
now SPLATTERS on the face of Life.

With stains like patch work,
Like a work of art,
You stare back at him and think now -
How dare his silence
Taps now at your door.

- *Oshanthaka Cabraal*

## සුසුම.....



වැස්ස වැටෙන
සඳ හංගන
සීත රැයක
නුඹව සොයමි.....

නුඹ වෙනුවෙන්
හීන පිපුන
පුංචි ළයේ
නුඹ සතපමි.....

නුඹට හොරෙන්
පහත් වෙලා
ඔය තොල්මත
සුවඳ උරමි....

දෑස පියන්
සුවෙන් නිදන
නුඹේ සුසුමක
සැඟව නිදමි...

- **අමිල ද සිල්වා**

## සමුගැන්ම...


සිය ගණන් පෙම්වතුන්
තුරු සෙවන යට ඉදන්
පෙම් වදන් මුමුනමින්
ආදරෙන් ඉන්නවා...

ඒ උයනෙ තුරු සෙවනෙ
නුඹ එක්ක පිය මැන්න
අතීතෙට මට ආයෙ
යන්නටම හිතෙනවා...

ජීවිතේ දුර යන්න
නුඹට තනි නෑ තවත්
නුඹ එක්ක පිය මනින
තව සිතක් තියෙනවා...

සංසාරෙ පුරාවට
නුඹෙ සුසුම් විඳගන්න
දුටුව ඒ සිහිනයෙන්
මම ඉතින් මිදෙනවා....

- **රන්කොත්**





## The True Self...

Anchor'd in thee, eald and strong to protect thou,
Thine little and mates, live in peace and love;
'Tis rain, green and timber bestowed by thy grace.
Wide and steady are thy might, deep blue:
Thither, bound to last and merry till entity.
Wight-greedy, envious for thy might and power;
High upon 'tis plain blue and white; glad and free,
Compounded from thy love's sacrifice; flight.
But thy felling is oft just and glory,
'Lease sight into thine, killing thee;
Erstwhile now not, squalls only drought and dirt;
Centuries of awe and lustre is rust,
"Saw, breathed and quenched; hereat new of life is not,
Be here all, yea did naught than say!"

- *Grey and Green*



# Upcoming Events:

**TRANSGENDER DAY OF REMEMBRANCE**
November 20th

**16 Days of Activism Against Gender-Based Violence Campaign**
November 25 - December 10

**WORLD AIDS DAY**
DECEMBER 1

december 10
**human rights day**



# YOU ARE NOT ALONE



## සිතට සහනයක්
## மனதிற்கு ஒரு நிம்மதி

Are you a woman who loves women? A man who loves men? Do you love both men and women? Are you having issues with your sexual orientation or your gender identity?

Do you feel isolated because cannot share your thoughts and aspirations with anyone?

If you answered “YES” to any of the questions above, then do give our trained counsellors a call.

We offer a free general counselling service for Lesbian, Gay, Transgender and Questioning (LGBTIQ) persons and a counselling service specifically for Lesbian and Bisexual women through a secure and cnfidential hotline.

ඔබ කාන්තාවකට ආදරය කරන කාන්තාවක්ද? පිරිමියෙකුට ආදරය කරන පිරිමියෙක්ද? නැත්නම් ගැහැණු පිරිමි දෙපාර්ශ්වයටම කැමති අයෙක්ද? ඒ ඔබගේ ලිංගික නැමියාවයි. ඔබ ලිංගික නැමියාව හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාව නිසා ගැටළුවලට මුහුණ පාන අයෙක්ද?

ඔබගේ හැගීම්, අදහස්, ප්‍රශ්න වෙනත් අයෙකු සමග බෙදාගැනීමට නොහැකිව තනිවෙලාද?

ඉහත ප්‍රශ්නවලට ඔබගේ පිළිතුර ‘‘ඔව්’’ නම්, අපගේ පළපුරුදු උපදේශකවරුන්ට දුරකථන ඇමතුමක් ලබාදෙන්න.

අපි සමසෙනෙහස් පුරුෂයන්, කාන්තාවන්, සංක්‍රාන්ති සමාජභාවීය හා තම අනන්‍යතාව ප්‍රශ්නභාවී ප්‍රජාව වෙනුවෙන් නොමිලයේ දුරකථන මාර්ගික උපදේශන සේවාවක් පවත්වනු ලැබේ. විශේෂයෙන් සමසෙනෙහස් හා ද්විසෙනෙහස් කාන්තාවන් සදහා විශේෂ උපදේශන සේවයක් සැපයීමට අපි සූදානම්. ඔබගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.

நீங்கள் பெண்ணை விரும்பும் பெண்ணா? ஆணை விரும்பும் ஆணா? அல்லது இருவரையும் விரும்புவாரா? உங்களுடைய பாலினம் மற்றும் பாலின நாட்டம் காரணமாக ஏதேனும் பிரச்சனைக்கு முகம் கொடுகின்றிர்களா?

உங்களுடைய தனிமை பிரச்சனைக்கு முடிவில்லை எமக்கு கூறுங்கள் எமது ஆலோசகர்கள் முலம் சிறந்த ஆலோசனை வழங்கப்படும்? எமது ஆலோசனைகள் நம்பி, நங்கை, திருனர் மற்றும் பாலின கேள்விகுரியவர்களுக்கு(LGBTIQ) வழங்கப்படும். தகவல்கள் முற்றிலும் பாதுகாப்பானது

**Monday to Friday 9.30am – 5.30pm**

General counseling line- +94112805187

Lesbian and Bisexual women counseling Line - +94115679766

Transgender counseling line- +94115734530

**සදුදා සිට සිකුරාදා දක්වා උදෑසන 9.30 සිට හවස 5.30 දක්වා**

සාමාන්‍ය උපදේශන ඇමතුම් සේවාව - +94112805187

සමසෙනෙහස් හා ද්විසෙනෙහස් කාන්තාවන් සදහා විශේෂ උපදේශන සේවය - +94115679766

සංක්‍රාන්ති පුද්ගල උපදේශන ඇමතුම් සේවාව - +94115734530

**திங்கள் முதல் வெள்ளிவரை காலை9.30 - மாலை 5.30**

பொது ஆலோசனைக்கு - +94112805187

பெண் ஓரினச்சேர்க்கையாளர் மற்றும் இருபாற்செயற்கை பெண்களுக்குரிய ஆலோசனைக்கு - +94115679766

மாற்றுப்பாலினத்தவருக்குரிய ஆலோசனைக்கு - +94115734530

the

# re·pub·lk

*restaurant . pub . sri lanka*

57, HOSPITAL STREET, COLOMBO 01, SRI LANKA

T +94117446654

www.facebook.com/therepublk

